WE DELIVER RESULTS...

Australian Migration

Susantha Katugampala
LL.B (Monash)

Barrister & Solicitor
Registered Migration Agent 96/86306

Australian Qualified Sri Lankan Lawyer - Melbourne, Australia.
Sri Lankan Community Awards Winner - Australia.

FAIRFIELDS
IMMIGRATION LAWYERS

Australia:

10 Morrison Place, East Melbourne,
Victoria 3002, Australia.
Tel: +61 3 9650 4557
Fax: +61 3 9650 4559

Sri Lanka:

3 Melbourne Avenue, Colombo 04.
Tel: 011 2555693
Fax: 011 2555694
Mobile: 0777 347670

Email: fairfields.lawyers@bigpond.com

මඩකලපුවේ උපන් සරවනමුත්තු මහ කණපතිපිල්ලේ මහතා ඩග්ලස් දේවානන්ද මහතාගේ පොද්ගලික මිතුයෙකි. දැනට වසර 10 ක පමණ කාලයක සිට ඔහු ඇමතිවරයාගේ මහජන සබඳතා නිලධාරියා වශයෙන් කටයුතු කරයි. සාමාන්‍ය ජනතාව සමඟ ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කරන කණපතිපිල්ලේ මහතා ඉඩම් ගිම් පොහොසතෙකි.

ඔහු මඩකලපුවේ සිට කොළඹ පදිංචියට ආවේ එම ප්‍රදේශයෙහි පවතින අයහපත් යුද වාතාවරණය හේතුකොට ගෙනය. එම නිසා ඔහුට එම ප්‍රදේශයේ තිබුණු සියලු දේපළ අහිමි විය. ඔහුට වලච්චේන නගරය ආසන්නයේ පමණක් ඉඩම් අක්කර 250 ක් පමණ ඇත. දැනට වලච්චේන යුද හමුදා කඳවුර පවත්වාගෙන යන්නේත් ඔහුගේ එම ඉඩමේය.

එම ඉඩම හමුදා කඳවුරක් පවත්වාගෙන යෑමට ලබාගැනීම නිසා ඒ වෙනුවට නුවරඑළිය ප්‍රදේශයෙන් අක්කර 250 ක් ලබාදෙන බවට රජය පොරොන්දු විය. නමුත් විවිධ ප්‍රශ්න ඉදිරිපත් කරමින් එය ලබා දීමට රජය කල්මැරූ බව ඊ.පී.ඩී.පී. සංවිධානයේ මාධ්‍ය ප්‍රකාශක නෙල්සල් එදිරිසිංහ මහතාගේ අදහසයි.

ඊ.පී.ඩී.පී. සංවිධානයේ සියලුම දෙනාට අද වනවිට කොටින්ගෙන් එල්ල වී ඇත්තේ දරුණු පීඩිත තර්ජනයකි. එවැනි තත්ත්වයක් තුළ ඔවුන් සියලුදෙනාම ආරක්ෂාව සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දැක්විය යුතුය. නමුත් ණපතිපිල්ලේ මහතා මේ ගැන දැක්වූයේ අඩු තක්සේරුවකි.

ඔහු නිතර දෙවේලේ ප්‍රකාශ කළේ " මම මහජන සම්බන්ධතා නිලධාරි. මම ඉන්නේ මහජනතාව සමඟ. මාව මහජනතාව රැක ගන්නවා. මට කවුරුත් අනතුරක් කරන්නේ නෑ." යන පදනමේය. එසේ දැඩි විශ්වාසයකින් පසුවූ කණපතිපිල්ලේ මහතාට අවසානයේ මැරුම්කෑමට සිදුවූයේ තමන්ගේ දෙමළ ජාතික කොටි පිස්තෝලකරුවෙකුගේ වෙඩි පහරකිනි.

කොටි ප්‍රහාරයට ලක්වූ ඔහු කළුබෝවිල රෝහලට ඇතුළත් කරන විටත් මියගොස් සිටියේ ය. පසුව දේහය මගින්ද මල් ශාලාවේ තැන්පත් කර තැබීමෙන් අනතුරුව පසුගිය ජූලි මස 26 වැනිදා පස්වරු 3.00 ට පමණ දෙකිවල ආදාහනාගාරයේදී අවසන් කටයුතු සිදු කෙරිණි. ඔහුව ඝාතනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඊ.පී.ඩී.පී. සංවිධානය තුළින් ලැබුණද, නැද්ද යන්න පරීක්ෂණ අංශවල විමසුමට භාජනය වී ඇත. මේ ගැන පරීක්ෂණ කොළඹ ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති පූජිත ජයසුන්දර මහතාගේ උපදෙස් මත කොළඹ අපරාධ කොට්ඨාස කාර්යාංශයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සරත් ගුණොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

මෙම ඝාතනය සඳහා කොටි පිස්තෝලකරුවන් දෙදෙනෙක් සෘජු සෙසම සම්බන්ධ වී ඇති අතර ඊට අදාළ ඔත්තු බැලීමට හා වෙනත් තොරතුරු සැපයීමට තවත් කිහිපදෙනෙක් සම්බන්ධ වන්නට ඇති බව පරීක්ෂණ අංශ සැක පහළ කර සිටී. නමුත් ඊට අදාළ කිසිවෙක් අත්අඩංගුවට ගැනීමට අදාළ අංශ තවමත් සමත් වී නැත.

පසුගිය අප්‍රේල් 24 වැනිදා හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා ඝාතන ප්‍රයත්නය ජූලි මස 5 වැනිදා වැලිසරදී නාවික භටයන් 40ක් ඝාතනය කිරීමේ ක්ලේමෝ බෝම්බ ප්‍රහාරය, ජූලි මස 17 වැනිදා කොළඹ වරායට ළඟ කිරීමට සූදානම් වූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය යන සියල්ල ව්‍යාර්ථ කිරීමට රජයේ ආරක්ෂක අංශය සමත් වුවත් ඊ.පී.ඩී.පී. සංවිධානයේ නායක ඩග්ලස් දේවානන්ද මහජන සම්බන්ධතා නිලධාරි සරවනමුත්තු මහකණපතිපිල්ලේ මහතා බිලි ගැනීමට කොට පිස්තෝලකරුවෝ සමත් වූහ.

නමුත් තවත් කොටින්ගේ වැදගත් හා ප්‍රබල ඉලක්කයක් ව්‍යාර්ථ කිරීමට පසුගිය ජූලි මස 14 වැනිදා රාජ්‍ය බුද්ධි සේවය (S.I.S.) සමත් විය. ඒ ජනාධිපති මගින්ද රාජපක්ෂ මහතාව ඝාතනය කිරීමට පැමිණි මරාගෙන මැරෙන කොටි කතක් තිස්සමහාරාමයෙන් අත්අඩංගුවට ගැනීමත් සමඟය.

ඇය 1979 නොවැම්බර් මස තුන්වෙනිදා උපත ලැබූ යාපනය, පාසිඩුර් ප්‍රදේශයේ පදිංචි "මරියදාස් ඇනස්ට් නන්ද සුජා" නමැති දෙමළ ජාතික තරුණියකි. ඇයගේ නියම නම එය වුවත් ඇය භාවිත කළේ සුජ්පයියා මනෝහරි යන නාමයයි. ඊට අමතරව ඇයට කොටි සංවිධානය මගින් "විද්‍යා" සහ ඉලෙයි ඉසෙජි යන ව්‍යාජ නම් දෙක සිය භාවිතය සඳහා ලබා දී තිබිණ.

මාතලේ කන්දරාවත්ත ප්‍රදේශයේ පදිංචි "කුමාර්" නමැති දෙමළ ජාතිකයාගේ නිවසේ ලිපිනයට ව්‍යාජ හැඳුනුම්පතක් සකස් කරගෙන ඇය පදිංචි වී සිටියේ තිස්සමහාරාම මහසෙන්පුර අංක 160/1 දරණ නිවසේ ය. එහි දෙමළ යුවලක් වාසය කරයි.

ඔවුන් නම් 45 හැවිරිදි කන්දයියා විශ්වනාදන් සහ 40 හැවිරිදි රත්නම්ට තිරුමතිය. මඩකලපුවේ ඉපදී හැදී වැඩුණු ඔවුන් 1983 දී පමණ තිස්සමහාරාමයේ ඉඩම මිලදී ගෙන එහි පදිංචියට පැමිණ ඇත. ඔවුන්ගේ දූ දරුවන් තවමත් ජීවත් වන්නේ මඩකලපුවේ ය. ඒ අය කොටි හිතවාදීන්ය.

ගවයන් ඇති දැඩි කරමින් එළවළු වගාකර විකුණමින් සිය ජීවිකා වෘත්තීය කරගෙන යෑමට කන්දයියා විශ්වනාදන් සහ රත්නම් තිරුමතී යුවළ සමත් විය. මඩකලපුවේ ක්‍රියාකාරී කොටි නායකයකු වන "අජිත්" රත්නම් තිරුමතිගේ බෑණා කෙනෙකි.

ඔහුගේ මාර්ගයෙන් "මරියදාස් ඇනස්ට් නන්ද සුජා" නමැති මරාගෙන මැරෙන කොටි කාන්තාව මඩකලපුවේ සිට කොළඹට පැමිණ තිස්සමහාරාම නිවසට මීට මාස තුනකට පමණ පෙර පැමිණ ඇත. ඔවුන් පැමිණ ඇත්තේ සාමාන්‍ය මගී ප්‍රවාහන සේවයෙනි. මෙලෙස පැමිණෙන විට ස්ථාන කිහිපයකින්ම හමුදාවේ සහ පොලිසියේ පරීක්ෂාවට ලක්වී ඇතත්, කිසිදු චකිතයකින් තොරව සමාන්‍ය දෙමළ ජාතික යුවලක් ලෙස වෙස් වලාගෙන "අජිත් සහ සුජා" නමැති කොටි යුවළ තිස්සමහාරාම නිවසට පැමිණ ඇත.

මීට පෙරත් මෙම දෙදෙනා එම නිවසට පැමිණ ටික කාලයක් ගතකර ආපසු මඩකලපුවට ගොස් ඇත. මෙවර ඔවුන් පැමිණ ඇත්තේ දෙවැනි වතාවටය. අජිත් සුජාව නිවසේ නතර කර ආපසු මඩකලපුව බලා ගොස් ඇත. සුජාට සිංහල බස සාමාන්‍ය මට්ටමින් කතා කිරීමට පුළුවන්ය. ඇය තිස්සමහාරාම නිවසේ නතර වී සිටිමින් හරක අපලයක් දුරුකර ගැනීමට පුද පූජා පැවැත්වීමේ මුවාවෙන් තිස්සමහාරාම කෝවිලකට යෑමට ඒමට පුරුදු වී සිට තිබේ. ඒ හරහා අදය ජනාධිපති මගින්ද රාජපක්ෂ මහතාව ඝාතනය කිරීමට අවශ්‍ය මූලික වටපිටාව සකස් කරමින් සිට ඇත.

දකුණු පළාත ජනාධිපතිවරයාගේ නිජබිමය. ඔහු නිතර දෙවේලේ තිස්සමහාරාමය, තංගල්ල ප්‍රදේශවල සංචාරය කිරීමට පුරුදු වී සිටියේය. එවැනි අවස්ථාවක මරාගෙන මැරෙන බෝම්බ කට්ටලයක් බඩේ බැඳගෙන ගොස් පුපුරුවාගෙන ජනාධිපතිවරයාව ඝාතනය කිරීම කොටි සංවිධානය මගින් "මරියදාස් ඇනස්ට් නන්ද සුජා" ට පැවරුණ රාජකාරිය වෙයි.

තවත් කරුණක් නම් අගෝස්තු මස 10 වැනිදා තෙක් කතරගම මහා දේවාලයේ පෙරහර පැවැත්වෙයි. එහි බස්නායක නිලමේ ශමිඳු රාජපක්ෂ මහතා ය. ඔහු ජනාධිපති මගින්ද රාජපක්ෂ මහතාගේ වැඩිමහල් සොයුරු කෘෂිකර්ම අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගේ පුත්‍රයාය. මෙම පෙරහර බැලීමට ජනාධිපතිවරයා පැමිණීමට නියමිතව සිට ඇත. එවිට එම ස්ථානයට කොටි උපක්‍රමශීලි ලෙස ඇතුලු වී ජනාධිපතිවරයාව ඝාතනය කිරීමට කොටි සංවිධානයේ 'රොයි" රහස් ඔත්තු ඇංශයේ නායක "ශිව ශංකර්" පොට්ටු අම්මාන්" ගෙන් "සුජා" ට උපදෙස් ලැබී ඇත. එම මරාගෙන මැරෙන කොටි කාන්තාව භාවිත කළේ "සැමිසුන්" වර්ගයට අයත් ජංගම දුරකථනයකි. ඉන් අදය සෘජුවම "පොට්ටු අම්මාන්" සමඟ දුරකථනය ඔස්සේ අදහස් හුවමාරු කරගෙන ඇත. "ආනන්දි අක්කා" යනුවෙන් හැඳින්වෙන කොටි කතක්ද මෙම ඝාතන කුමන්ත්‍රණයට සම්බන්ධ වී ඇත.

එමෙන්ම ජනාධිපති ඝාතන ඉලක්කය සපුරා ගැනීම උදෙසා තවත් කොටි දොළොස් දෙනෙක් පමණ උතුරේ සිට කතරගම, තංගල්ල, තිස්සමහාරාම ප්‍රදේශවලට පැමිණ සැඟවී සිටින බවට රාජ්‍ය බුද්ධි සේවය (S.I.S.) සැක පහළ කර සිටියි.

එම අයට වෙන වෙනම කොටස් පවරා ඇත. ඝාතන ඉලක්කයේ සම්පූර්ණ තොරතුරු කිසිම කෙනෙක් දන්නේ නැත. දන්නේ තමන්ට පවරා ඇති කොටසේ තොරතුරු පමණි. එවැනි සැලසුම් සහගත පියවරක් සෑම ප්‍රහාරයකදීම අනුගමනය කිරීම කොටි ඔත්තු ඇංශ නායක පොට්ටු අම්මාන්ගේ සාමාන්‍ය සිරිතකි.

ඊට හේතුව වන්නේ කිසියම් ප්‍රශ්නයක් මත එක් අයෙක් හෝ අත්අඩංගුවට පත් වුණොත් සැලසුමේ සියළු තොරතුරු හෙළිදරව් වීම වළක්වා ගැනීමට අවශ්‍ය වීමයි. අත්අඩංගුවට පත්වන අයට එවිට ප්‍රකාශ කළ හැක්කේ ඔහු දන්නා කොටස් පමණි. වෙනත් දෙයක් ප්‍රකාශ කිරීමට ඔහු දන්නේ නැත. මෙය ඉතා දක්ෂ හා සැලසුම් සහගත ගරිල්ලා යුද උපක්‍රමයකි. අද "සුජා" අත්අඩංගුවට පත්වී ඇතත් අයටත් ප්‍රකාශ කිරීමට හැකියාව ඇත්තේ අය දන්නා සීමිත කොටසකි. ඊට වැඩිය බැරිය. මේ නිසා පරීක්ෂණ අංශවලටත් යා හැකි දුර ඉතා සීමිතය.

අයව අත්අඩංගුවට ගෙන ජනාධිපති ඝාතන ප්‍රයත්නය වළක්වා ගැනීමට හැකියාව ලැබුණේ රාජ්‍ය බුද්ධි සේවය (S.I.S.) නිසාය. එසේ නොවුණ් නම් ජනාධිපතිවරයාට ජීවිතයෙන් වනදි ගෙවීමට සිදුවෙනවා ඇත.

ජනාධිපති මගින්ද රාජපක්ෂ මහතාව ඝාතනය කිරීමට පැමිණ තිස්සමහාරාම මහසෙන්පුර අංක 160/1, දරණ නිවසේ පදිංචි වී සිටි "මරියදාස් ඇනස්ට් නන්ද සුජා" නමැතිත්තියගේ නිවසේ ගෘහ මූලිකයන් වන "කන්දයියා විශ්වනාදන් හා රත්නම් තිරුමතී" ගැන රාජ්‍ය බුද්ධි සේවයේ තෙත ගැටුණේ මීට මාස හයකට පමණ පෙර සිටය. එනම් එම යුවළ කොටි සංවිධානය සමඟ සම්බන්ධකම් පවත්වන බවට සිය

5 වන පිටට